පොදු දේපල රැකගැනීමේ වැඩසටහන
Programme for Protection of Public Resources
பொதுச்சொத்துக்களை பாதுகாக்கும் நிகழ்ச்சித்திட்டம்

TRANSPARENCY INTERNATIONAL SRI LANKA
Building a Nation of Integrity

No. 28/1, Bullers Lane, Colombo 07, Sri Lanka Tele : 011 5654654, 011 5769769 Fax : 011 5627432 Email : pppr2010@gmail.com Web : www.tisrilanka.org

# නිරීක්ෂණ වාර්තාව - 02

## 2010 ජනවාරි 10

### 1: හැඳින්වීම

ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා (TISL) ආයතනයේ පොදු දේපල රැකගැනීමේ වැඩසටහනේ (PPPR) පළමුවන වාර්තාව 2009-12-31 දින එළිදක්වන ලද අතර මෙවර (2010) ජනාධිපතිවරණයේදී රාජ්‍ය දේපල අයථා පරිහරණයට යොදාගෙන ඇති විවිධ අවස්ථා රාශියක් එමගින් පෙන්වාදෙන ලදි. විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍ය හරහා විකාශය කෙරෙන, සහ ප්‍රචාරය කෙරුන අතිමහත් දැන්වීම් ප්‍රමාණය අනුව ජනාධිපතිවරණ ව්‍යාපාරයේ පිරිවැයෙහි යම් යම් පැතිකඩවල් ද එම වාර්තාවෙන් අනාවරණය කෙරුණ අතර දේශපාලන පක්ෂ විසින් වැයකරන අරමුදල් සම්බන්ධයෙන් විනිවිද භාවයක් පවත්වා ගැනීමේ අවශ්‍යතාව ද එහිදී අවධාරණය කරන ලදි.

### 1.1 පළමු වාර්තාවට ලැබූ ප්‍රතිචාර

2010-01-01 දින ඩේලි මිරර් පුවත්පත අපගේ පළමු වාර්තාවට අදාළව ප්‍රථිචාර කිහිපයක් පළකර තිබිණ.

- ඩේලි මිරර් පුවත්පතට අදහස් දක්වා තිබූ අයි.ටී.එන්. ආයතනයේ ප්‍රවෘත්ති හා කාලීන වැඩසටහන් පිළිබඳ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිවරයා තමන් තුලාව දේශපාලන වැඩසටහන මෙහෙයවීමෙන් ඉවත්වූ බව සඳහන් කර තිබුණි. එහෙත් රාජ්‍ය මාධ්‍ය ආයතනයක ඉහළම තනතුරක් දරමින් දේශපාලන පක්ෂයකට සහාය දැක්වීම සම්බන්ධව නැගූ ප්‍රශ්ණයට පිළිතුරු දීම ඔහු ප්‍රතික්ෂේපකර තිබුණි.

  අයි.ටී.එන්. ප්‍රවෘත්ති හා කාලීන සිදුවීම් නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි සුදර්මන් රදලියගොඩ මහතා තවමත් එම තනතුර දරන අතර එම රූපවාහිනී ආයතනයේ ප්‍රවෘත්ති සහ කාලීන වැඩසටහන් සියල්ලකම වගකීම සුපුරුදු පරිදිම දරනු ලැබේ. මෙය සෘජුවම මැතිවරණ කොමසාරිස්වරයාගේ නියෝග නොසලකා හැරීමක් වනුයේ ඔහු තවමත් ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ කුරුණෑගල දිස්ත්‍රික් ආසන සංවිධායකවරයෙකු ලෙස ද කටයුතු කිරීම නිසාය. මැතිවරණ කොමසාරිස්වරයාගේ නියෝග ප්‍රකාරව තමන් තුළාව දේශපාලන සංවාදයෙන් ඉවත්ව සිටින බව රදලියගොඩ මහතා ප්‍රකාශ කළද ඔහු නිත්‍යානුකූල වශයෙන් සිදුකළ යුතුව ඇත්තේ මැතිවරණය අවසන් වන තෙක් මාධ්‍ය කටයුතු වලින් බැහැරව සිටීමය. එසේ නොකිරීම මැතිවරණ නීති උල්ලංඝනය කිරීමකි.

- රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ අනූෂ පැල්පිට මහතා ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ දේපල එක්සත ජනතා නිදහස් සන්ධානයේ මැතිවරණ ප්‍රචාරක කටයුතු සඳහා යොදාගන්නා බව ප්‍රතික්ෂේප කර තිබිණි.

නමුත්, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ ශ්‍රවණාගාරය එක්සත් ජනතා නිදහස් සංධානයේ ජනපති අපේක්ෂකයාගේ සහය පිණිස පැවති ප්‍රවෘත්ති සාකච්ඡාවට ලබාදී තිබූ බව පසුගිය ජනවාරි 07 වැනිදා ලංකාදීප පුවත්පතේ පළවූ වාර්තාව මගින් තහවුරුවේ.

- ගුවන් හමුදාවට අයත් හෙලිකොප්ටර් යානාවකින් රජයේ අමාත්‍යවරුන් සහ මන්ත්‍රීවරුන් මහනුවර මැතිවරණ ප්‍රචාරක රැළියකට ප්‍රවාහනය කළේ ඔවුන් විසින් ඒ සඳහා මුදල් ගෙවීමෙන් පසුව බව ගුවන් හමුදා මාධ්‍ය ප්‍රකාශක වින්ග් කමාන්ඩර් ජනක නානායක්කාර මහතා අපගේ පළමු වාර්තාවට ප්‍රතිචාර දක්වමින් ප්‍රකාශ කර තිබුණි.

  පසුගිය ජනාවරි 05 වන දින අප විසින් ගුවන් හමුදාපති රොෂාන් ගුණතිලක මහතා වෙත ලිපියක් යවමින් දේශපාලන පක්ෂ ගුවන් හමුදාවේ හෙලිකොප්ටර් යානා කුළියට ගෙන ඇත්නම් ඒ සඳහා මුදල් ගෙවූ කුවිතාන්සි හෝ අදාළ ලියකියවිලි ඉදිරිපත් කරන ලෙස ඉල්ලා සිටියෙමු. නමුත් මේ දක්වාම එම ලිපියට ගුවන්හමුදාපතිවරයා කිසිඳු ප්‍රතිචාරයක් දක්වා නොමැත. පොදු දේපල රැකගැනීම සඳහා වන වැඩසටහන සෘජුවම ප්‍රකාශ කරන්නේ මුදල් ගෙවා හෝ මහජන දේපල මැතිවරණ ප්‍රචාරක කටයුතු සඳහා යොදාගැනීමට නීතියෙන් ඉඩක් නොමැති බවය. මැතිවරණ කොමසාරිස්වරයාගේ නියෝග අනුව මේ බව වඩාත් තහවුරු වේ.

- අපගේ පළමු වාර්තාවට ප්‍රතිචාර දක්වමින් ලංකා ගමනාගමන මණ්ඩලයේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිවරයා ප්‍රකාශ කර තිබුණේ ලංගමය කිසිදු හෝ දේශපාලන පක්ෂයක රැළියකට බස්රථ ලබාදී නොමැති බවත්, කෙසේ නමුත් කිලෝ මීටර් 75 කට නොඅඩු ගමනාන්තයක් සඳහා ලංගම බස් රථ කිලෝ මීටරයකට රුපියල් 65/- දීමනාවක් යටතේ කුළියට ගත හැකි බවත්ය.
  කෙසේ නමුත් ජනාධිපතිවරයාගේ මැතිවරණ ප්‍රචාරක රැළි සඳහා ආධාරකරුවන් ප්‍රවාහනයට ලංගම බස් රථ යොදාගත් අවස්ථා පිළිබඳව විමර්ශණය කරන ලද තොරතුරු හා සාක්ෂි විශාල ප්‍රමාණයක් පොදු දේපල රැකගැනීමේ වැඩසටහන සතුව ඇත. එමෙන්ම රජයේ කිසිදු හෝ මෝටර් රථයක් මුදල් ගෙවා හෝ මුදල් ගෙවීමෙන් තොරව මැතිවරණ ප්‍රචාරක කටයුතු සඳහා යොදාගැනීම තහනම් බව මැතිවරණ කොමසාරිස්වරයා සිය නියෝග වල පැහැදිලිව දක්වා ඇත. ජනාධිපති ලේකම් කාර්යාලය පුවත්පත් නිවේදයක් නිකුත් කරමින් අරලියගහ මන්දිරයේ පැවති මැතිවරණ ප්‍රචාරක රැස්වීම හා අනෙකුත් කටයුතු වලදී ඊට සහභාගීවන්නන්ට ලබාදුන් ආහාර හා අනෙකුත් දේ සඳහා වැය කරන ලද්දේ ජනාධිපතිවරයා අයත් දේශපාලන පක්ෂයේ මුදල් සහ ස්වෙච්ඡාවෙන් ලබාදෙන ලද අරමුදල් බව සඳහන් කර තිබුණි. මේ අතර පොදු දේපල රැකගැනීමේ වැඩසටහන ඉකුත් ජනවාරි 05 වැනිදා ජනාධිපති ලේකම්වරයා වෙත ලිපියක් යවමින් එලෙස මුදල් ගෙවූ වවුචර වල පිටපත් ලබාදෙන ලෙස ඉල්ලීමක් කරන ලද නමුත් එයට මෙතෙක් ප්‍රතිචාර ලැබී නැත.

  කෙසේ නමුත් මැතිවරණ කොමසාරිස්වරයාගේ නියෝග අනුව, කිසිඳු හෝ මැතිවරණ ප්‍රචාරයකට අදාළ කටයුත්තක් සඳහා රජයේ ගොඩනැගිලි නොමිලයේ යොදාගැනීම තහනම්ය. එහෙත් අරලියගහ මන්දිරයේ පැවති මැතිවරණ ප්‍රචාරණයට අදාළ රැස්වීම් වලදී එහි ගොඩනැගිලි යොදාගැනීම ඇතුළු විදුලිය හා ජලය සඳහා යම් ගෙවීමක් සිදුකර ඇත්දැයි ජනාධිපති ලේකම්වරයා සිය නිවේදනයේ සඳහන් කර නැත.

## 2: නිශ්චිත අයථා පරිහරණයන්

2010 ජනවාරි 09 දින වන විට පොදු දේපල රැකගැනීමේ වැඩසටහන වෙත (PPPR) රාජ්‍ය දේපල අයථා පරිහරණය හා මැතිවරණ නීති උල්ලංඝනය කිරීම පිළිබඳ පැමිණිලි 157 කට වඩා ලැබී ඇත. පළමුවන වාර්තාවෙන් අවධාරණය කෙරුණු ඒවාට අමතරව මෙම පැමිණිලි වලින් පරීක්ෂා කොට තහවුරු කරගන්නා ලද රාජ්‍ය සම්පත් අයථා පරිහරණයන් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

**2.1 ලේක්හවුස් ආයතනයඃ**

ජනාධිපතිවරයා වෙනුවෙන් වූ ප්‍රචාරක වැඩකටයුතු සඳහා ලේක්හවුස් ආයතනය තුළ අයථා ලෙස පරිහරණය කෙරෙමින් පවතින වත්කම් හා සම්පත් සම්බන්ධයෙන් (PPPR) වෙත ලැබුණු පැමිණිලි අතරින් තහවුරු කරගන්නා ලද තොරතුරු කිහිපයක් පහත දැක්වේ.

(අ) ලේක්හවුස් ආයතනයේ මුද්‍රණය කළ ජනාධිපතිවරයාගේ ප්‍රචාරක පෝස්ටර් තොගයක් රැගෙන යාම සඳහා 2010-01-05 දින රාත්‍රි 11.45 ට පමණ අංක යුහ 0856 දරණ කොල පැහැති කැබ් රථයෙන් ශ්‍රී ලංකා යුද හමුදාවේ සොල්දාදුවන් තිදෙනෙකු පැමිණ තිබේ. මැතිවරණ පෝස්ටර් ඇලවීම සඳහා හමුදා සොල්දාදුවන් යොදාගන්නා බවද තහවුරු වී ඇත.

(ආ) ජනාධිපති රාජපක්ෂ මහතාගේ ප්‍රතිපත්ති ඉස්මතු කරමින් වර්ණයෙන් මුද්‍රිත පිටු පනස් දෙකක අතිරේකයක් ලේක්හවුස් ආයතනය මුද්‍රණය කර තිබේ. මෙම අතිරේකය මුද්‍රණය කිරීම සඳහා භාවිතා කර ඇත්තේ 70 gsm තත්ත්වයේ ඉතා ඉහල මට්ටමේ ගුණාත්මකභාවයෙන් යුත් කඩදාසිය. නොමිලේ බෙදාදීම පිනිස සැකසුණු අතිරේකයක් වන මෙහි මුද්‍රණ කටයුතු වැඩ අංක 4842 යටතේ 2009-12-30 දින ආරම්භ කර තිබේ. මෙහි පිටපත් ලක්ෂයකට ආසන්න ප්‍රමාණයක් මුද්‍රණය කොට ඇති අතර මෙම අතිරේකය එක්සත් ජනතා නිදහස් සන්ධානයේ ආධාරකරුවන් ගෙයින් ගෙට යමින් ප්‍රචාරක කටයුතු මෙහෙයවීමේ ව්‍යාපාරයේදී 2010-01-09 දින බෙදාහැර තිබේ. එහි එක් පිටපතක් මුද්‍රණය සඳහා වැයවී ඇති මුදල රුපියල් 35/- කි.

(ඇ) 'අපි පුතෙකු ගැන කතාකරමු' මාතෘකාව යටතේ වර්ණ පිටු අටක අතිරේකයක් ලේක්හවුස් ආයතනයේ මුද්‍රණය කර 2010-01-10 දින සිළුමිණ පුවත්පත සමඟ නොමිලයේ බෙදාහරින ලදි.

(ඈ) මැතිවරණ සමයන්හි දී බලයේ සිටින දේශපාලන පක්ෂ ලේක්හවුස් ආයතනයේ සම්පත් යොදාගනිමින් ප්‍රචාරක දැන්වීම් සහ අනෙකුත් ප්‍රචාරක ලිපි ලේඛන මුද්‍රණය කරවා ගැනීම කලක සිට සිදුවන්නකි. මෙහිදී සිදුවන්නේ පසුව මුදල් ගෙවීමේ පදනම යටතේ මෙම පත්‍රිකා මුද්‍රණය කරවාගෙන මැතිවරණයෙන් පසුව ගෙවිය යුතු එම ණය මුදල් කපා හැරීමය. ලේක්හවුස් ආයතනයෙහි මුද්‍රණය කළ ඉහත අතිරේකයට එක්සත් ජනතා නිදහස් සන්ධානය විසින් ගෙවීම් කර ඇත්දැයි PPPR වෙත තවමත් තහවුරු වන තොරතුරු ලැබී නැත. පොදු දේපල රැකගැනීමේ වැඩසටහනේ ස්ථාවරය වන්නේ මුදල් ගෙවීමක් සිදුකර හෝ දේශපාලන පක්ෂයකට හෝ අපේක්ෂකයෙකු ට රජයේ සම්පත් යොදාගැනීමට ඉඩක් නොමැති බවයි.

**2.2 ජාතික තරුණ සේවා සභාව**

2010-01-12 දින පෙරවරු 08.30 ට අරලියගහ මැඳුරේ පැවැත්වීමට නියමිත, ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතා ගේ දේශපාලන ප්‍රචාරක රැස්වීමක් පැවැත්වීම සඳහා එක් එක් දිස්ත්‍රික්කයෙන් තරුණ තරුණියන් 200 ක් බැගින් ගෙන ඒමට කටයුතු කරන ලෙස ජාතික තරුණ සේවා සභාව පළාත් හා දිස්ත්‍රික් නායකයන් වෙත දැනුම් දී තිබේ. එම තරුණ තරුණියන් ඔවුන්ගේ අදාළ දිස්ත්‍රික්වල සිට රාජ්‍ය වියදමින් ප්‍රවාහණය කිරීමට නියමිතව ඇති අතර මෙම රැස්වීමේදී බෙදා දීම සඳහා ජාතික තරුණ සේවා සභාව විසින් ටී-ෂර්ට් 7000 ක්ද මුද්‍රණය කරවා තිබේ.

**2.3. සමථ මණ්ඩල සාමාජිකයන්ට ගෙවීම්**

සමථ මණ්ඩල දිනය සෑම වසරකදීම ජුලි 18 වන දින දේශපාලනික නොවන උත්සවයක් වශයෙන් සමරනු ලබන්නකි. එසේ වුවද මෙවර 2010-01-08 දින අරලියගහ මන්දිරයට පැමිණ එම සැමරුම් උත්සවයට සහභාගි වන ලෙස සියළු සාමාජිකයන්ට ඇරයුම් කෙරෙන ලිපියක් සමථ මණ්ඩල කොමිෂන් සභාව (අධිකරණ අමාත්‍යාංශය යටතේ ඇති) විසින් නිකුත් කර තිබේ. සෑම සාමාජිකයෙකු විසින්ම තවත් 10 දෙනෙකු බැගින් කැඳවාගෙන එන ලෙස එම ලිපිය මගින් ඉල්ලා තිබිණි. මෙම රැස්වීමට 3000 කට අධික පිරිසක් සහභාගි වී ඇති අතර එම පිරිසට එක් අයෙකුට රුඃ500/-ත් 1000/- ත් අතර මුදලක් උත්සවයට සහභාගීවීම වෙනුවෙන් දීමනාවක් ලෙස ගෙවා තිබේ. සහභාගි වූවන්ට දිවා ආහාර පාර්සල්ද ලබාදී තිබේ.

**2.4 විපක්ෂ නායක නිලනිවස**

විපක්ෂ නායක කාර්යාලය ප්‍රවෘත්ති සාකච්ඡා පැවැත්වීම, පත්‍රිකා බෙදාහැරීම, මාධ්‍යවේදීන් හමුවීම වැනි ජනාධිපතිවරණ ප්‍රචාරක කටයුතු සඳහා යොදාගනිමින් තිබේ. මෙලෙස රාජ්‍ය සම්පත් මුදල් ගෙවා හෝ යොදවාගත නොහැකි බව පොදු දේපල රැකගැනීමේ වැඩසටහන නැවතත් අවධාරණය කර සිටී. විපක්ෂ නායකවරයාට සිය නිල නිවෙස යොදාගත හැක්කේ තම රාජකාරී කටයුතු හා නවාතැන් සඳහා පමණි.

1. 2009-12-08 වන දින ලක්ෂ්මන් කිරිඇල්ල මන්ත්‍රීවරයා විසින් විපක්ෂ නායක නිල නිවෙසේ ජනාධිපතිවරණ ප්‍රචාරක කටයුතු සම්බන්ධ පුවත්පත් සාකච්ඡාවක් පවත්වා තිබේ. එසේම 2009-12-30 වනදා ලක්ෂ්මන් කිරිඇල්ල මන්ත්‍රීවරයා විසින් තවත් ජනාධිපතිවරණ ප්‍රචාරක පුවත්පත් සාකච්ඡාවක් පවත්වා තිබේ.

මෙම පුවත්පත් සාකච්ඡා දෙකම පවත්වා ඇත්තේ පොදු අපේක්ෂකයාගේ සහායටය.

**2.5 අරලියගහ මැදුර සහ ජනාධිපතිවරයාගේ අනෙකුත් නිල නිවාස**

ජනාධිපතිවරයාගේ නිල නිවාස වූ අරලියගහ මැදුර සංග්‍රහ පැවැත්වීමට මෙන්ම දේශපාලන ප්‍රචාරක රැස්වීම් සඳහාද අඛණ්ඩව යොදාගනිමින් තිබේ. මෙම කටයුතු වෙනුවෙන් ඔහුගේ දේශපාලන පක්ෂය විසින් නිසි ගෙවීම් කරනු ලැබ ඇති බව ජනාධිපති ලේකම් කාර්යාලය සඳහන් කර ඇතත් පොදු දේපල රැකගැනීමේ වැඩසටහන තවදුරටත් කියා සිටින්නේ එය ගෙවීමක් සහිතව වුවත් එසේ යොදාගැනීමට නීතියෙන් ඉඩකඩක් නොමැති නිසා අයථා පරිහරණයක් ලෙසට තවදුරටත් සැළකෙන බවයි.

පහත දැක්වෙනුයේ මෙලෙස අරලියගහ මැදුර හා අනුරාධපුර ජනාධිපති නිල නිවහනට පැමිණ එහි දේශපාලන රැස්වීම්වලට සහභාගි වූ (පළමුවන වාර්තාවෙන් අවධාරණය කරන ලද ප්‍රමාණයට අමතරව) විවිධ පුද්ගල කණ්ඩායම් වලින් සමහරකි.

2010-01-05 - සමස්ථ ලංකා සිංහල කවි සම්මේලන සාමාජිකයන්, හස්ත කර්මාන්ත කරුවන් හා දහම් පාසල් ගුරුවරුන්.

2010-01-03 - රාජ්‍ය බැංකු සේවක සේවිකාවන්. (ඔවුන්ට ආරාධනා කර තිබී ඇත්තේ ඉහළ නිලධාරින් විසින් විද්‍යුත් තැපැල් පණිවිඩ මගිනි)

2010-01-02 - පෞද්ගලික බස්රථ හිමියන්ගේ සංගමයේ සාමාජිකයන්.

2010-01-01 - හෙදියන් හා වෘත්තීය පුහුණු සිසුන්, දේශීය වෛද්‍යවරුන්, ආයුර්වේද උපාධිධාරීන් සහ ගුරු අධ්‍යාපන නිලධාරින්. (අනුරාධපුරයේදී)

2009-12-30 - අරලියගහ මැදුරේදී විදේශ රැකියා කර්මාන්තයේ නියැළි අය හා මහනුවර දී සිවිල් ආරක්ෂක බලකායේ සාමාජිකයන්.

2009-12-25 - සණස බැංකු සේවක සේවිකාවන්. (මහනුවරදී)

2009-12-24 - මධ්‍යම පළාතේ එක්සත් ජාතික පක්ෂයේ ආධාරකරුවන් (මහනුවරදී)

2009-12-23 - මධ්‍යම පළාතේ ව්‍යාපාරික ප්‍රජාව (මහනුවරදී)

2009-12-22 - ව්‍යවසායකයන්/නව නිෂ්පාදකයන්.

මේ වනාහි රාජ්‍ය සම්පත් අයථා පරිහරණය කිරීමක් පමණක් නොවන අතර ජනාධිපතිවරයෙකු තෝරාපත්කරගැනීම සඳහා වූ පනතේ 77 වන වගන්තිය යටතේ 'සංග්‍රහ කිරීම' මැතිවරණ වරදක්ද වේ. ඉහත සඳහන් රැස්වීම් වලින් අනතුරුව සත්කාරයට පාත්‍ර වූ පුද්ගලයන් හෝ කණ්ඩායම් වලට ආහාර පාන වලින් සංග්‍රහ කිරීම පුරුද්දක් වශයෙන් දිගටම සිදුවෙමින් පවතියි.

## 2.6 නව වසරට සුභපතා කෙටි පනිවිඩ යැවීම

ජනාධිපතිවරයා විසින් 2010-01-01 දින සියළු පුරවැසියන්ට තමාගේ නව අවුරුදු සුබපැතුම කෙටි පනිවිඩ (SMS) මාර්ගයෙන් යැවීමට ක්‍රියාකර ඇත. එම පණිවිඩය මෙසේය. 'කිව් පරිදි ඔබට නිදහස් නිවහල් රටක් ලබාදුන්නෙමි. ඉදිරි අනාගතය සර්ව ප්‍රකාරයෙන්ම වාසනාවන්ත වේවා! සුභ නව වසරක් වේවා. මහින්ද රාජපක්ෂ' මාධ්‍ය වාර්තා වලට අනුව, (විශේෂයෙන් 2010-01-02 දින සති අන්ත Financial times පුවත්පත මෙම පනිවිඩය යවා ඇත්තේ ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිසන් සභාවේ නියෝග/උපදෙස් අනුවය. (TRC) විදුලි සංදේශ නියාමන කොමිසන් සභාව ශ්‍රී ලංකාවේ විදුලි සංදේශ නියාමනය පිළිබඳ එකම ආයතනය වන අතර එහි සභාපතිවරයා වන්නේ ජනාධිපති ලේකම් ලලිත් වීරතුංග මහතාය. සියළුම විදුලි සංදේශ සැපයුම්කරුවන් විසින් යවන්නා 'ජනාධිපතිවරයා' වශයෙන් දැක්වෙන එක හා සමාන කෙටි පනිවිඩ (SMS) එකම වේලාවක් තුළ යවන ලද බවට කිසිදු සැකයක් නැත. මෙම පහසුකම සලසාගත හැක්කේ විදුලි සංදේශ නියාමන කොමිසන් සභාවේ නියෝගයක් මත පමණකි. අනෙක් අතට මෙම පනිවිඩ යැවීමේ කාර්යය සඳහා ජනාධිපති රාජපක්ෂ මහතාගේ නැවත තේරීපත්වීමේ මැතිවරණ ව්‍යාපාරය විසින් හෝ රජයේ අරමුදල්වලින් ගෙවීම් කරන ලද්දේද යන්න පැහැදිලි නැත. එක් කෙටි පණිවිඩයක පිරිවැය ශත 50 සිට රුපියලක් අතර වෙතැයි ගණනය කළ හැකිය. ශ්‍රී ලංකවේ ජංගම දුරකථන මිලියන 12 කට වඩා ඇති බව සළකන විට ශ්‍රී ලංකාවේ සියළුම ජංගම දුරකථන ග්‍රාහකයන්ට මෙවැනි කෙටි පනිවිඩ යැවීමට අඩු ගනනේ රුපියල් මිලියන 6 ක් වැයවෙයි. මැතිවරණ කටයුතු සඳහා සිදුකරන වියදමේ ඉහළ යාමේ ප්‍රමාණය කෙතෙක්ද යන්න මෙමගින් සනාථවේ.

1991 අංක 25 දරන විදුලි සංදේශ පනතේ 5(ඊ) වගන්තියට අනුව, රටේ සුරක්ෂිතභාවය, මහජන සාමය, හා ජාතික ආරක්ෂාව වෙනුවෙන් ශ්‍රී ලංකා රජය විසින් තමන් වෙත දෙනු ලබන යම් සාමාන්‍ය හෝ විශේෂ උපදෙස් අනුව ක්‍රියා කරන ලෙස වූ නියෝග පිළිපැදීම වෙනුවෙන් නියාමන ක්‍රියාමාර්ග ගැනීමට ශ්‍රීලංකා විදුලි සංදේශ නියාමන කොමිසමට බලතල තිබේ. එම නිසා ඉහත දැක්වෙන් අවස්ථාවන් සම්බන්ධයෙන් විදුලි සංදේශ නියාමන කොමිසමේ නියෝග ක්‍රියාත්මක විය යුතු අතර එසේ නොවන්නේනම් එය නීතියෙන් බැහැර වීමක් ලෙස සැළකිය හැකිය.

## 2.7 රජයේ ගොඩනැගිලි හා වාහන අයථා පරිහරණයන්

### කැළණිය ඩිපෝව

පැලියගොඩ පිහිටි කැළණිය ශ්‍රී ලංගම බස් ඩිපෝව ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතාගේ මැතිවරණ ව්‍යාපාරයේ කාර්යාලයක් බවට පරිවර්තනය කරගෙන ඇත. ප්‍රචාරක දැන්වීම්, කොඩි හා ප්‍රචාරක පුවරු පරිශ්‍රය ඇතුළත් මෙන්ම පිටතද ප්‍රදර්ශණය කෙරෙමින් තිබේ. අවාසනාවකට මෙන් මෙකී ගොඩනැගිල්ල පිහිටා ඇත්තේ පැලියගොඩ පොලිස් ස්ථානයට යාබදවය. එමෙන්ම පුත්තලම ශ්‍රී ලංගම ඩිපෝව ද මෙලෙසම එක්සත් ජනතා නිදහස් සන්ධානයේ අපේක්ෂකයාගේ ප්‍රචාරක කාර්යාලයක් බවට පරිවර්තනය කරගෙන තිබෙන බව සනාථ වී ඇත.

### (අ) රජයේ වාහන

ජනාධිපතිවරයාගේ මැතිවරණ ප්‍රචාරක රැස්වීම් වලට සෙනග ගෙන ඒම සඳහා ශ්‍රී ලංගම බස්රථ යොදවා ගැනීමේ ප්‍රවණතාවක් තිබෙන බව දිවයිනේ විවිධ ප්‍රදේශ වලින් නිරීක්ෂණය වෙයි. ජනාධිපතිරයාගේ මිනුවන්ගොඩ රැලියට සෙනග ප්‍රවාහනය කිරීම සඳහා මොරටුව පානදුර මට්ටක්කුළිය මීතොටමුල්ල මහරගම අලුත්ගම රත්නපුර අවිස්සාවේල්ල මාවනැල්ල මාතලේ බලංගොඩ කුරුණෑගල උතුර කුරුණෑගල දකුණ සහ ජා-ඇල ඩිපෝවල බස්රථ යොදාගනු ලැබ ඇති අතර රුවන්වැල්ලේ පැවති රැලියට සෙනග ගෙන ඒම සඳහා නාවලපිටිය වත්තේගම හැටන් වලපනේ හා මාතලේ ශ්‍රීලංගම ඩිපෝවල බස්රථ යොදවාගෙන තිබිණ. පොදු දෙපල රැකගැනීමේ වැඩසටහන තවදුරටත් පෙන්වා දෙන්නේ මෙම බස් රථ භාවිතය වෙනුවෙන් මුදල් ගෙවීමක් යම් හෙයකින් සිදුකර තිබුණේ වුවද

මෙලෙස කිසිදු අයෙකුට පෞද්ගලිකව ඒවා වෙන්කරවා ගෙන මැතිවරණ වැඩට යොදාගත නොහැකි බවය.

(ආ) ශ්‍රී ලංකා මුස්ලිම් කොංග්‍රසය විසින් පාලනය කරනු ලබන කල්මුණේ නගර සභාවේ කාර්යාල පරිශ්‍රය සහ එහි වාහන ජෙනරාල් සරත් ෆොන්සේකා මහතාගේ මැතිවරණ ප්‍රචාරක කටයුතු වෙනුවෙන් යොදවාගනු ලැබීමට අවසර දී තිබීමද පොදු දේපල අයථා පරිහරණයක් ලෙස සැලකිය හැකිය.

**2.8 රජයේ නිලධාරීන්**

රජයේ නිලධාරීන් ක්‍රියාකාරී ලෙස මැතිවරණ ප්‍රචාරක ව්‍යාපාරයට සහභාගී වී සිටින බව තීරණය වේ. ආයතන සංග්‍රහයේ විධිවිධාන අනුව මාණ්ඩලික ශ්‍රේණිවල හා ඉහළ තනතුරු දරණ රජයේ නිලධාරීන්ට කිසිම මැතිවරණයකදී කිසිම අපේක්ෂකයෙකු වෙනුවෙන් දේශපාලන ප්‍රචාරක ව්‍යාපාර කටයුතු වල ක්‍රියාකාරී ලෙස නිරතවීමට නොහැකිය. රජයේ වැටුප් ලබන නිලධාරීන් දේශපාලන පක්ෂ ප්‍රචාරක ව්‍යාපාරය ප්‍රවර්ධනය කිරීමෙහිලා උත්සුක වනවිට එය පොදුවේ ජනාධිපතිවරණයේ සුපිළිපන්නභාවයට බලපායි.

මෙම මූලධර්ම උල්ලංඝනය කිරීම සම්බන්ධයෙන් උදාහරණ කිහිපයක් මෙසේය.

**(අ) විදේශ සේවය සඳහා දේශපාලන පත්වීම් ලැබූවන්ගේ ප්‍රචාරක කටයුතු**

තානාපතිවරුන් හා ශ්‍රී ලංකා කොන්සල් කාර්යාල වල ප්‍රධානීන් කිහිප දෙනෙකු (මේ අය ශ්‍රීලංකා විදේශ සේවයට අයත් නිලධාරීන් නොව එම සේවාවට බාහිරව පත්වීම් ලද අයයි) ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතා වෙනුවෙන් ක්‍රියාකාරී ලෙස මැතිවරණ ව්‍යාපාරයේ යෙදීම සඳහා ශ්‍රී ලංකාවට පැමිණ සිටියි. හේමන්ත වර්ණකුලසූරිය මහතා (ඉතාලිය) ජාලිය වික්‍රමසිංහ මහතා (එක්සත් ජනපදය) නිව්ටන් ගුණරත්න මහතා (මියන්මාරය). බන්දුල ජයසේකර මහතා (කොන්සල් ජනරාල් - කැනඩාව) එච්.එම්. සුහයිර් මහතා (ඉරානය) බෙනට් කුරේ මහතා (පිලිපීනය) අසිත පෙරේරා මහතා (දකුණු කොරියාව) යන අයවලුන් ඒ අතර වේ.

බන්දුල ජයසේකර මහතා සහ හේමන්ත වර්ණකුලසූරිය මහතාද ජනාධිපතිවරයාගේ උදව්වට රාජ්‍ය මාධ්‍ය වල පෙනී සිටිමින් කටයුතු කර ඇත. මෙහිදී සැළකිය යුතු වැදගත් කරුණක් වන්නේ මෙම පුද්ගලයන් දේශපාලන ප්‍රචාරක ව්‍යාපාරයෙහි යෙදී සිටින අතරතුර ඔවුන්ට රජය විසින් අඛණ්ඩව එම උසුලන තනතුරු වෙනුවෙන් ගෙවීම් කරනු ලබන බවයි. ඉහත සඳහන් කළ විදේශ තානාපති කාර්යාල හා කොන්සල් කාර්යාල වලට තම ප්‍රධානීන්ගෙන් තොරව මැතිවරණය අවසන් වන තෙක් අඛණ්ඩව ක්‍රියාත්මක වීමට සිදුව තිබේ.

**(ආ) අමාත්‍යවරුන්ගේ පෞද්ගලික කාර්ය මණ්ඩල විසින් කරනු ලබන අයථා පරිහරනයන්.**

ඇමැතිවරයෙකුට පෞද්ගලික කාර්ය මණ්ඩලය සඳහා පුද්ගලයන් 05 ත් 10 ත් අතර පිරිසක් හිමිවන අතර වාහන, ඉන්ධන, දුරකථන පහසුකම් ද නොමිලයේ සැපයේ. ඔව්හු සක්‍රිය ලෙසත් නියමිත සහ අනියම් ලෙසත් එම අමාත්‍යාංශ වලට අයත් රුපියල් මිලියන ගණනක් වටිනා රාජ්‍ය සම්පත් පරිහරණය කරති. මේ වන විට රජය සතු ඇමැතිවරුන්ගේ සංඛ්‍යාව 110 කි. ඒ අනුව එම ඇමැතිවරුන්ගේ පෞද්ගලික කාර්ය මණ්ඩල වල විශාල සංඛ්‍යාවක් රජයෙන් වැටුප් ලබමින් මැතිවරණ ව්‍යාපාරයේ යෙදී සිටිති. එක්සත් ජනතා නිදහස් සන්ධානයට සහාය දෙන මෙම පෞද්ගලික කාර්ය මණ්ඩල සාමාජිකයන් රාජ්‍ය සේවකයන්ගේ ගණයට අයත් වන්නේද යන්න ගැන ඇතැම් අමාත්‍යාංශවල ලේකම්වරුන් අවිනිශ්චිත තත්ත්වයක පසුවන බව පොදු දේපල රැකගැනීමේ වැඩසටහන විසින් කරන ලද විමසීම් වලදී පෙනී ගොස් ඇත. කෙසේ වුවද ඔවුන් රජයේ පොදු අරමුදලින් ගෙවීම් ලබන බවට සැකයක්

නොමැත. එසේම ඔවුන් රජයේ සියළුම නීති රීති පිළිපැදීමට බැඳී සිටිති, එම නිසා රජයේ වියදමින් දේශපාලන ප්‍රචාරක ක්‍රියාකාරකම් වල නිරත වීමට ඔවුන්ට අවකාශයක් තිබිය නොහැකිය.

**(ඇ) අමාත්‍යාංශ ලේකම්වරු සහ අනෙකුත් රාජ්‍ය නිලධාරීන්**

මාධ්‍ය මගින් පුළුල් ලෙස වාර්තා කර ඇති පරිදි ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්වරයා දේශපාලන ප්‍රචාරක රැස්වීම් වලට සහභාගී වී ඇත. 2010 ජනාධිපතිවරණ ඡන්දයේදී ජෙනරාල් සරත් ෆොන්සේකා මහතාට ප්‍රචාර දැක්වීම් වශයෙන් රජයේ වියදමින් සංවිධානය කරන ලද 'විජයග්‍රහණයේ කතාව අද සහ හෙට' නමැති දේශපාලන වැඩසටහනට ඔහු තම සහභාගීත්වය ලබාදී තිබේ.

(11) අත්තනගල්ල ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවේ රැස්වීමක් 2009-12-28 වන දින පස්වරු 05.00 ට පැවැත්වෙන බව දන්වමින් අත්තනගල්ල ප්‍රාදේශීය ලේකම් එස්.ජී.විජයබාහු මහතා විසින් 2009-12-18 දින දාතමින චක්‍රලේඛයක් නිකුත් කරනු ලැබ තිබුණි. එකී චක්‍රලේඛයට අනුව මෙම රැස්වීම ගම්පහ විජයාරාම මාවතේ අංක 15/3 දරණ ස්ථානයේ පැවැත්වීමට නියමිතව ඇති බවද දන්වා තිබුණු අතර එම ස්ථානය ගම්පහ දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී සරණ ගුණවර්ධන මහතාගේ නිවෙස මෙන්ම ඔහු දේශපාලන සාකච්ඡා පවත්වන ස්ථානයද වශයෙන් හඳුනාගනු ලැබ තිබේ. රජයේ මෙබඳු රැස්වීම් පවත්වනු ලබන්නේ අත්තනගල්ල ප්‍රාදේශීය මහා ලේකම් කාර්යාලීය රැස්වීම් ශාලාවේය. මේ අනුව ඉහත රැස්වීම අත්තනගල්ල ප්‍රාදේශීය ලේකම්වරයා විසින් කැඳවනු ලැබ ඇත්තේ දේශපාලන අවශ්‍යතාවක් වෙනුවෙන් බව පැහැදිලිවම නිගමනය කළ හැක.

මහජන බැංකුවේ සභාපති ඩබ්ලිව් කරුණාජීව මහතා ඇතුළු මහජන බැංකුවේ ඉහළ නිලධාරීන් පසුගිය ජනවාරි 06 වැනිදා එක්සත් ජනතා නිදහස් සන්ධානයේ අපේක්ෂකවරයාගේ ඡන්ද ප්‍රචාරක පත්‍රිකා බෙදාහැරීමේ නිරත වී තිබේ. මෙම මැතිවරණ නීති උල්ලංඝනය කිරීමේ සිදුවීම පිළිබඳව ලංකා බැංකු සේවක සංගමයේ ලේකම්වරයා මැතිවරණ කොමසාරිස්වරයාට පැමිණිලි කර ඇත.

පොලිස් විශේෂ කාර්ය බලකායේ අණ දෙන නිලධාරිවරයා ඉකුත් දෙසැම්බර් 11 වන දින චක්‍රලේඛයක් නිකුත් කරමින් ඉදිරි ජනාධිපතිවරණයේදී වත්මන් ජනාධිපතිවරයාට ඡන්දය දීම සුදුසු බව හැඟෙන බවට පණිවිඩයක් විශේෂ කාර්ය බලකායේ සියළුම සාමාජිකයන්ට යවා ඇත. ජනමාධ්‍ය ඔස්සේ ඉමහත් ප්‍රතිචාරයක් ලැබුණු මෙම චක්‍රලේඛයට අනුව ත්‍රස්තවාදයට එරෙහි යුද්ධය සංවර්ධන ක්‍රියාදාමය මෙන්ම රජයේ ක්‍රියාකාරකම්ද සඳහන් කරමින් ජනාධිපතිවරයාට ඡන්දයදීම සුදුසු වන්නේ ඇයි දැයි ඍජුවම සඳහන් කර ඇත.

ජනාධිපති ආරක්ෂක අංශයේ නියෝජ්‍ය පොලිස්පති එස්.ඒ. වික්‍රමසිංහ මහතා ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතා වෙනුවෙන් වූ ඡන්ද ව්‍යාපාරයට සක්‍රීය වශයෙන් මැදිහත්ව සිටී. ඔහු විසින් ගාලු පාර දිගට මොරටුව දක්වා පිහිටි පොලිස් ස්ථාන වල පොලිස් නිලධාරීන් 2010-01-01 දින මහානාම මහා විද්‍යාලයීය ශ්‍රවණාගාරයට කැඳවා ජනාධිපතිවරයාට සහය දක්වන දේශපාලන කතාවක් පවත්වා තිබේ.

**2.9 නීති විරෝධී ගෙවීම්.**

ජනාධිපතිවරයාගේ සහභාගිත්වයෙන් 2009-12-25 දින කල්පිටියේ ආලංකුඩා පිටියේ පැවැති රැස්වීමට පැමිණ සිටි මන්නාරම ප්‍රදේශයේ පුද්ගලයන්ට නොමිලේ ප්‍රවාහන පහසුකම් සලසා දෙනවාට අමතරව එක් අයෙකුට රුපියල් 500/- බැගින් ගෙවීමට රිසාඩ් බදුර්දීන් මහතා යටතේ ඇති නැවත පදිංචි කිරීම් හා ආපදා සහන සේවා අමාත්‍යාංශයෙන් කටයුතු කර තිබේ.

## 3. රාජ්‍ය මාධ්‍ය සහ රජයේ තොරතුරු

3.1 රාජ්‍ය වෙබ් අඩවි.

පොදු දේපල රැකගැනීමේ වැඩසටහන විසින් 2009-12-17 වන දින සිට 2010-01-05 දින දක්වා www.gov.lk, www.defence.lk, www.news.lk යන රජයේ වෙබ් අඩවි තුන නිරීක්ෂණ කරන ලද අතර ඒවා සම්පූර්ණයෙන්ම පාහේ ජනාධිපතිවරයා වෙනුවෙන් වූ මැතිවරණ ව්‍යාපාරයේ ප්‍රචාරක කටයුතු සඳහා යොදවා ගෙන ඇති බව අනාවරණය කරගන්නා ලදි.

(1) www.defence.lk වෙබ් අඩවිය ආරක්ෂක අමාත්‍යාංශය විසින් පවත්වාගෙන යන අතර එහි විපක්ෂයේ පොදු අපේක්ෂක සරත් ෆොන්සේකා මහතාට එරෙහි මැතිවරණ ප්‍රචාරයට අදාළ තොරතුරු පළකිරීමත් ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතාට ඍජුවම වාසිදායක වන කරුණු ඇතුළත් මැතිවරණ ප්‍රචාරක ව්‍යාපාරයේ තොරතුරු පළකිරීමට යොදාගෙන ඇති බව පෙනේ.

(2) රජයට අයත් www.gov.lk වෙබ් අඩවියද ජනාධිපතිවරයාට වාසි සහගත වන ප්‍රචාරක ප්‍රවෘත්ති වලින් ගහන වී ඇත. පහත දැක්වෙන්නේ ඊට උදාහරණ කිහිපයකි.

- විපක්ෂ සන්ධානය සත්වයන්ගේ සහ උරගයන්ගෙන් ගහන සංවිධානයකි.
- මුහුණ රතු කරගත් දයාසිරි රතු ඉර සංවාදයෙන් පලායයි.

(3) www.news.lk වෙබ් අඩවියේද සවිස්තරාත්මක මැතිවරණ ප්‍රචාරක තොරතුරු ඇතුළත් පුවත් පළකර ඇත. ඉන් පුවත් 88ක් පරීක්ෂා කරන ලද අතර ඒ අතරින් 45 ජනාධිපතිවරණයට අදාළ ඒවා විය. එම 45න් 29 ක් ජනාධිපතිවරයාගේ මැතිවරණ ප්‍රචාරක ව්‍යාපාරයට වාසිදායක ඒවා වේ. ඉතිරි පුවත් සියල්ල ඍජුවම විපක්ෂයේ පොදු අපේක්ෂකයාට එරෙහි ඒවාය. විපක්ෂයේ පොදු අපේක්ෂකයාට වාසිදායක කිසිදු පුවතක් නොවූවා පමණක් නොව ඔහුගේ මැතිවරණ ප්‍රචාරක ව්‍යාපාරය පිළිබඳ මධ්‍යස්ථ ලෙස සැකසුන පුවතක් හෝ නොවීය.

## 4. ප්‍රචාරක ව්‍යාපාරයේ පිරිවැය.

රටේ මැතිවරණ වියදම් ඉහළ නංවමින් ප්‍රචාරක දැන්වීම් ව්‍යාපාරය ගෝලීයකරණය වී තිබේ. විදේශයන්හි ප්‍රසිද්ධ කෙරෙන පුවත්පත් වල, වෙබ් අඩවි, විශේෂයෙන් ටෙලිග්‍රාෆ්, දි ඉන්ඩිපෙන්ඩන්ට්, දි ඉන්ටනැෂනල් හෙරල්ඩ්, ට්‍රිබියුන්, ද නිව්යෝර්ක් ටයිම්ස්, ද සිඩ්නි මෝනිං හෙරල්ඩ්, ද හින්දු , දි ඉන්ඩියන් එක්ස්ප්‍රෙස්, ද හින්දුස්ථාන් ටයිම්ස්, ද ගාඩියන් සහ ෆේස් බුක් වෙබ් අඩවි වල ජනාධිපතිවරයාගේ ප්‍රචාරක දැන්වීම් පළවී ඇත

විදේශීය මාධ්‍ය වල පළවී ඇති ඉහත සඳහන් දැන්වීම් වල පිරිවැයට අතිරේක වශයෙන් 'තාරුණ්‍යට හෙටක්' සංවිධානයේ සහ එක්සත් ජනතා නිදහස් සංධානයේ මුද්‍රිත හා විද්‍යුත් මාධ්‍ය ප්‍රචාරක දැන්වීම් වල වියදම 2009-12-31 වන දිනට රුපියල් මිලියන 200ක (රුපියල් ලක්ෂ 2000) සීමාව ඉක්මවා ගොස් තිබිණ.

එක්සත් ජාතික සංධානයේ හා සරත් ෆොන්සේකා මහතාගේ විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍ය දැනවීම් ප්‍රචාරක කටයුතු වල වියදම් සංසන්දනාත්මකව බලන විට 2009-12-31 දින වනවිට රුපියල් 70,54,000/- මට්ටමක පවතී. මෙම අරමුදල් තමන් වෙත ලැබෙන්නේ කෙසේද යන්න හා ඉන් කවර කොටසක් මැතිවරණය වෙනුවෙන් තමන් විසින් වියදම් කරනු ලැබීමට අදහස් කරන්නේ ද යන්න දේශපාලන පක්ෂ විසින් මහජනතාවට අනාවරණය කරන්නේ ද යන්න වැදගත්ය.

2009-12-01 දින සිට 2009-12-31 දින දක්වා වන කාලය තුළ ප්‍රධාන අපේක්ෂකයන් දෙදෙනාගේ මැතිවරණ දැන්වීම් වියදම් පිළිබඳ විස්තර මෙසේය.

එක්සත් ජනතා නිදහස් සංධානය

| මාධ්‍යය | අවස්ථා ගණන | පිරිවැය (රුපියල් වලින්) |
|---|---|---|
| රූපවාහිනී | 2376 | 46 540 600 |
| ගුවන් විදුලි | 2463 | 8 668 600 |
| පුවත්පත් | 356 | 30 859 500 |
| එකතුව | 2419 | 86 068 700 |

තාරුණ්‍යට හෙටක්

| මාධ්‍යය | අවස්ථා ගණන | පිරිවැය (රුපියල් වලින්) |
|---|---|---|
| රූපවාහිනී | 4616 | 109 808 100 |
| ගුවන් විදුලි | 2245 | 8 791 300 |
| පුවත්පත් | - | - |
| එකතුව | 6861 | 11 85 99 400 |

එක්සත් ජාතික පෙරමුණ/එක්සත් ජාතික පක්ෂය හා ජනතා විමුක්ති පෙරමුණ එකතුව සරත් ෆොන්සේකා මහතා වෙනුවෙන්

| මාධ්‍යය | අවස්ථා ගණන | පිරිවැය (රුපියල් වලින්) |
|---|---|---|
| රූපවාහිනී | 45 | 21 06 200 |
| ගුවන් විදුලි | 10 | 3 86 800 |
| පුවත්පත් | 24 | 45 61 000 |
| එකතුව | 79 | 70 54 000 |

ඉහත දැක්වෙන පිරිවැය ගනන් බැලීම් කරන ලද්දේ සාමාන්‍ය වශයෙන් අදාළ රේට් ගනන් අනුව වුවද මැතිවරණ දැන්වීම් වලට අයකරන මිල මීට වඩා බෙහෙවින් වැඩිය. තවදුරටත් මෙම ගනන් වලට ප්‍රචාරක දැන්වීම් නිෂ්පාදනයට වැයවූ මුදල් ඇතුළත්ව නැත.

### 4.2. රජයේ ආයතන වල අනුග්‍රහයෙන් ඉදිකර ඇති දැන්වීම් පුවරු හා දැන්වීම්

කොළඹ නගරය තුළ ඇති ප්‍රචාරක දැන්වීම් පුවරු ගණනාවක්ම පිහිටුවා තිබෙන්නේ රාජ්‍ය ආයතන වල වියදමෙනි. රාජ්‍ය වානිජ සහ විවිධ නීතිගත සංස්ථාව සහ නාගරික සංවර්ධන අධිකාරියේ වියදමෙන් පිහිටුවා ඇති ප්‍රචාරක දැන්වීම් පුවරු මහරගම නුගේගොඩ සහ හෝමාගම ප්‍රදර්ශණය කෙරේ. මෙම ආයතන නඩත්තු කරනු ලබන්නේ ශ්‍රී ලාංකේය මහජනතාවගෙන් එකතු කරගනු ලබන බදු මුදල් වලින් බව සලකනවිට මෙය ඉතාමත් පැහැදිලිව රාජ්‍ය අරමුදල් අයථා පරිහරණයක් මෙන්ම මැතිවරණ නීති උල්ලංඝනය කිරීමක්ද වන්නේය.

පොදු දේපල රැකගැනීමේ වැඩසටහනේ ස්ථාවරය වන්නේ දේශපාලන පක්ෂ විසින් තම තමන්ගේ ප්‍රචාරක ව්‍යාපෘතිවල වියදම් පක්ෂ අරමුදල මගින්ම දරාගත යුතු බවයි.

ප්‍රචාරක ව්‍යාපාරයේ ඉතා ඉහළ පිරිවැය පොදු දේපල අයථා පරිහරණයට මඟ පාදන අතර එය ශ්‍රී ලංකාව වැනි සංවර්ධනය වෙමින් පවතින රාජ්‍යයක් මත මහත් වූ බරක් පැටවීමකටද හේතුවන්නේය. අපගේ පළමුවන වාර්තාවෙන් පෙන්වා දී ඇති පරිදි මෙම අතිමහත් අයථා පරිහරණයන් ඍජුවම නිදහස් අධ්‍යාපනයට නිදහස් සෞඛ්‍ය සේවයට හා පොදු ප්‍රවාහනයට අවාසිදායක බලපෑමක් ඇතිකරයි. එම කේෂත්‍රයන්හි වියදම් පියවා ගැනීම සඳහා ඉහළ බදු පැනවීමේ අවදානමකට මෙය හේතු වනු ඇත.

**නිගමනය**

ඉහත තොරතුරු මගින් රටේ මැතිවරණ ක්‍රියාදාමය තුළ පවත්නා අසාධාරණත්වය පෙන්වා දෙන අතර මැතිවරණ ක්‍රියාදාමයේ සුපිළිපන්න භාවය කෙරෙහිද ප්‍රමාණවත් අභියෝගයක් එල්ල කරයි. බලයේ සිටින පුද්ගලයන් රාජ්‍ය දේපල ආරක්ෂා කිරීමේ වගකීමෙන් බැඳෙන බාරකරු වන නමුත් මෙහිදී එම දේපල වල අර්ථලාභීන් බවට පත්වී තිබේ. ඔවුන් විසින් ප්‍රජාතන්ත්‍රවාදය හා නීතියට ගරුකිරීමේ වටිනාකම් ඉතා නරක ලෙස නොතකා හැරීමේ තත්ත්වයක් මෙමගින් ප්‍රදර්ශණය කර තිබේ. රාජ්‍ය අරමුදල් විනිර්මුක්තියකින් යුතුව පෞද්ගලික ලාභ  ප්‍රයෝජන තකා අයථා පරිහරණය කළ හැකි බව පමණක් ඔවුන් විසින් තේරුම් ගෙන තිබේ.

පොදු දේපල රැකගැනීමේ වැඩසටහනේ ප්‍රථම වාර්තාව හා මෙම වාර්තාවේ ඉංග්‍රීසි හා දෙමළ පිටපත් www.tisrilanka.org වෙබ් අඩවියට පිවිසීමෙන් ලබාගත හැකිය